# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායස , බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1523/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திகதி
Date — 29/09/2024
පැය 1025

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.09.28 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 81.75 | 360 | යකඩ බැරල් 06 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය හා කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශය.**

2024.09.28 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශ III හි නිලධාරීන් කණ්ඩායමක් විසින් තලංගම පොලිස් වසමේ බත්තරමුල්ල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 25 මිලි ග්‍රෑම් 500 ක්, කේරළ ගංජා ග්‍රෑම් 51 ක් හා මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් බවට සැක කරන මුදල් රුපියල් 274400/= ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තලංගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන බත්තරමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගාල්ල සේනාංක බුද්ධි අංශය.**

2024.09.28 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගාල්ල සේනාංක බුද්ධි අංශ නිලධාරීන් කණ්ඩායමක් විසින් රත්ගම පොලිස් වසමේ පත්විල හන්දිය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 09 මිලි ග්‍රෑම් 380 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රත්ගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන රත්ගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** රත්ගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. නීති විරෝධීව වගා කර තිබූ ගංජා පැල සමඟ සැකකරුවන් දෙදෙනෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර.**

2024.09.28 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් තණමල්විල පොලිස් වසමේ පළුගස්වැව හා අරඹේකෙම ප්‍රදේශයන් වලදී වැටලීම් සිදු කර නීති විරෝධිව වගාකරන ලද ගංජා පැල 6312 ක් හා 27920 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන තණමල්විල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 34 හා 44 වයස්වල පසුවන තණමල්විල හා අරඹේකෙම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.** තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**